# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 83 — 1973 ඔක්තෝබර් 26 වැනි සිකුරාදා — 1973.10.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1463 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1470 |


**සැළකිය යුතුයි.**—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලියක් ද පළවේ.

## තනතුරු—ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරවනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1:1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1:2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම් කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1:3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය; අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

**2. දීමනා**

2:1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

### 3. සේවා කොන්දේසි : සාමාන්‍ය

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාල අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

### 4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, (අවශ්‍ය නම්) අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත් හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු, රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

### 5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්යේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6%ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

### 6. යුද්ධ සේවා අනුග්‍රහය

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාව තීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා

ගැනීම සඳහා ඔවුන්ට තමතමන්ගේ වයස්වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

**7 : 1** රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

**7 : 2** නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

**7 : 3** යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතුවනු ඇත.

**7 : 4** අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

**7 : 5** මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ,

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

**8 : 1** සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

චිත්‍රකලා පරීක්ෂක තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ චිත්‍රකලා පරීක්ෂක තනතුරු සඳහා අයදුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 1973 නොවැම්බර් මස 20 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ චිත්‍රකලා පරීක්ෂක තනතුරු යනුවෙන් සඳහන් කළ යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**— තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම් තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්ත නොවන්නේ නම් මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු/නිලධාරිනියක තෝරා ගනු ලැබුවහොත්, ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් වනු ඇත.

**3. වැටුප් ක්‍රමය.**—රුපියල් 4,296 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 144 ක වාර්ෂික වැටුප් වැඩිවීම් 16 කින් ද, රුපියල් 5,304 ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉමකින් ද, යුක්තව වාර්ෂික වැටුප රුපියල් 6,600 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත් ය. (මෙම වැටුප් ක්‍රමයේ කල්පිත වැටුප් පරිමාණය රු. 1,980—120×16—රු. 3,900 ක් විය.)

**4. අවශ්‍ය සුදුසුකම් :—**

(i) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයකින් යුක්ත විය යුතුය.

(ii) 1973.11.20 දිනට තමාගේ වයස අවුරුදු 23 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව බල නොපානු ඇත.)

(iii) **අධ්‍යාපන සුදුසුකම් :—**

(අ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබූ චිත්‍රකර්ම ගුරු සහතික පත්‍රය ලබා තිබීම හෝ, **රජයේ ලලිත කලායතනයේ** (රජයේ කලා හා කලා ශිල්ප විද්‍යාලයේ) චිත්‍රකර්මය හා පින්තාරු කිරීම පිළිබඳ සාමාන්‍ය පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ,

**රජයේ ලලිත කලායතනයේ** (රජයේ කලා හා කලා ශිල්ප විද්‍යාලයේ) චිත්‍රකර්මය හා පින්තාරු කිරීම පිළිබඳ උසස් පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ ශාන්ති නිකේතනයේ විශ්වභාරතී කලායතනයේ, ලලිත කලා හා හස්ත කර්මාන්ත හතර අවුරුදු පාඨමාලාව හැදෑරීමෙන් පසු පිරිනැමෙන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

සහ

(ආ) සිංහල භාෂාව හෝ සාහිත්‍යය ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථය ලබා තිබීම හෝ, දෙවාරයකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම.

(ඉ) චිත්‍ර කර්මය ඉගැන්වීම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ලබා තිබීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කෙරුණු සහතිකය හෝ භාරගනු නො ලැබේ).

(ආ) ඉහත 4 (iii) යටතේ දැක්වෙන අධ්‍යාපන හා ශාස්ත්‍රීය සුදුසුකම් දැක්වෙන සහතික.

(ඉ) චරිත සහතික දෙකක්. (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂවරයකුගෙන් හෝ විද්‍යාලයීය ආචාර්වරයාගෙන් විය යුතුය. දැනටමත් රජයේ සේවකයන් වන අපේක්ෂකයන්ට අදාළ නොවේ.)

(ඊ) චිත්‍ර කලාව ඉගැන්වීම පිළිබඳ පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලා එවූ අවස්ථාවකදී එකී ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවට ලැබී, ප්‍රමාදය සඳහා සැළකියයුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියකුගේ පුද්ගලික නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහිද අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් මෙම කාර්යාලයට ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973. 10. 10,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

චිත්‍රකලා පරීක්ෂක තනතුරු පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. නම (මුලකුරු සමඟ) :———. මයා/මිය/මෙනෙවිය.

2. සම්පූර්ණ නම :———.

3. රාජකාරි ලිපිනය :———.

4. පෞද්ගලික ලිපිනය :———.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :———.
   (ආ) පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද ? :———.

6. උපන් දිනය :— අවුරුද්ද :———. මාසය :———. දිනය :———.

7. 1973.11.20 දිනට වයස, අවු :———. මාස :———. දින :———.

8. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :—
   (i) තනතුර :———.
   (ii) ස්ථිරද, තාවකාලිද ? :———.
   (iii) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :———.
   (iv) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :———
   (v) දෙපාර්තමේන්තුව :———.
   (vi) ආයතනය/සේවා ස්ථානය :———.
   (vii) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :———.
   (viii) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :———.

9. ඉගෙනුම ලැබූ පාසැල් හා ආයතන (පිළිවෙලින් සඳහන් කරන්න.)

| පාසල/ආයතනය | සිට | දක්වා |
|---|---|---|

10. අධ්‍යාපන සුදුසුකම් :—

| සහතික පත්‍රය | වර්ෂය | විෂයයන් |
|---|---|---|

11. ශාස්ත්‍රීය සුදුසුකම් :—

| සහතිකය | වර්ෂය | නිකුත් කළ ආයතනයේ නම |
|---|---|---|

12. පළපුරුද්ද (චිත්‍රකර්මය ඉගැන්වීම පිළිබඳව) :—

| පාසල/ආයතනය | සිට | දක්වා | මුළු කාලය | අස්වීමට හේතුව |
|---|---|---|---|---|

13. කිසියම් චෝදනාවකට අධිකරණය විසින් ඔබ වරදකරුවකු කරනු ලැබ සිටීද ? (එසේ නම් විස්තර දක්වන්න) :———.

14. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකරනු ලැබූ වේද ? (එසේ නම් විස්තර දක්වන්න.) :———.

15. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසුව වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

10-802—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය.

---

### ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

පුරප්පාඩු

වලවේ යෝජනා ක්‍රමයෙහි පහත සඳහන් ගණකාධිකාරි තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

1. **ප්‍රධාන ගණකාධිකාරි, 2 වැනි ශ්‍රේණිය :**

අයදුම්කරුවන් අවුරුදු 28 ටත් 45 ටත් අතර විය යුතුයි. පහත සඳහන් සුදුසුකම් ඔවුන්ට තිබිය යුතුයි.

වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ පිරිවැය සහ පාලනය පිළිබඳ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී, රජයේ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක දෛනික මුදල් පරිපාලනය, අයවැය වාර්තා පිළියෙල කිරීම සහ අනුකලන පිරිවැය/මුදල් ගණකාධිකරණ ක්‍රම පිළිබඳ පශ්චාත් සුදුසුකම් දැක්වෙන අවුරුදු පහක අවම පළපුරුද්දක් තිබීම.

සියල්ලම අන්තර්ගතව අවුරුද්දකට රු. 18,240—5×600—රු. 21,240 දරණ වැටුප් පරිමාව මත මණ්ඩලයේ සේවයෙහි II වැනි ශ්‍රේණියට පත්වීම දෙනු ලැබේ. වැටුප් පරිමාවෙහි වැටුප් තලයකට පත්කිරීම ගැන සලකා බලනු ලැබේ.

2. **ගණකාධිකාරි, 3. වැනි ශ්‍රේණිය :**

අයදුම්කරුවන් අවුරුදු 28 ටත් 45 ටත් අතර විය යුතුයි. පහත සඳහන් සුදුසුකම් ඔවුන්ට තිබිය යුතුයි.

(1) වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ පිරිවැය සහ පාලනය පිළිබඳ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් සහිතව යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පශ්චාත් සුදුසුකම් දැක්වෙන පළපුරුද්දක් තිබීම.

(2) වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් හෝ පිරිවැය සහ පාලනය පිළිබඳ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, I, II, III, සහ IV වැනි කොටස් වලින් සමරථවී හෝ ඒ හා සමාන සුදුසුකම් ඇතුව යටත් පිරිසෙයින් ගිණුම් කටයුතු පිළිබඳ අවුරුදු 10 ක පළපුරුද්දක් තිබීම.

සියළුම දීමනා අන්තර්ගතව අවුරුද්දකට රු. 15,840—5 × 480—රු. 18,240 දරණ වැටුප් පරිමාව මත මණ්ඩලයේ සේවයෙහි 111 වැනි ශ්‍රේණියට පත්වීම දෙනු ලැබේ.

**3. ගණකාධිකාරී, IV වැනි ශ්‍රේණිය :**

අයදුම්කරුවන් අවුරුදු 25 ටත් 35 ටත් අතර විය යුතුයි. පහත සඳහන් සුදුසුකම් ඔවුන්ට තිබිය යුතුයි :—

(1) වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ පිරිවැය සහ පාලනය පිළිබඳ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමර්ථවීම හෝ ඒ සමාන වෘත්තීය සුදුසුකම් තිබීම,

හෝ

(2) වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ මධ්‍යම පරීක්ෂණයෙන් හෝ පිරිවැර සහ පාලනය පිළිබඳ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ I, II, III සහ IV වැනි කොටස්වලින් සාමාර්ථය ලැබ, ගිණුම් පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 4 ක පළපුරුද්දක් තිබීම.

(3) 5 වැනි ශ්‍රේණියෙහි උපරිම වැටුප මත අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මණ්ඩලයේ සේවයෙහි නියුතු ගණකාධිකාරීවරුන්

සියළුම දීමනා අන්තර්ගතව අවුරුද්දකට රු. 10,920—12 × 300—රු. 14,520 දරණ වැටුප් පරිමාව මත මණ්ඩලයේ සේවයෙහි IV වැනි ශ්‍රේණියට පත්වීම දෙනු ලැබේ.

**සැළකිය යුතුයි.**—යථෝක්ත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති මණ්ඩලීය නිලධාරීන්ගෙන් ද, වයස සැළකිල්ලට නොගෙන අයදුම් පත් භාරගනු ලැබේ.

තමන්ගේ වයස, වෘත්තීය සුදුසුකම්, පළපුරුදුකම් සහ තමන් දැනට දරණ තත්ත්වය සඳහන් කරමින් අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි. සහතික පත්වල පිටපත් අයදුම් පතට යාකොට එවිය යුතුය.

1973 නොවම්බර් මස 17 වැනි දින හෝ ඊට ප්‍රථම මෙහි පහත අත්සන් කර ඇති අයට ලැබෙන සේ අයදුම්පත් එවිය යුතුය.

සභාපති,
ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1973. 10. 15.

10–844—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

| අංකය | තනතුර | ශ්‍රේණිය | ඒකාබද්ධ වැටුප් ක්‍රමය |
|---|---|---|---|
| 1 | ගිනිභට නායක | සී—1 | රු. 300—410 / 6 × 10 : 4 × 12.50 |
| 2 | ටැංකි රථ නල වැද්දුම්කරු | සී—2 | රු. 240—340 / 10 × 10 |
| 3 | පෙදරේරුකරු | සී—4 | රු. 215—290 / 5 × 5 : 5 × 10 |
| 4 | පොම්ප සහායක | සී—4 | එම |
| 5 | බැටරි සවිකරන්නා | සී—4 | එම |

අවශ්‍ය සුදුසුකම්.—

විශෙෂ : අංක 1

(අ) ගිනිනිවීම සම්බන්ධව අවුරුදු 15ක පළපුරුද්දක් තිබිය යුතු ය.
(ආ) බරවාහන පැදවීම සඳහා වලංගු රියැදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර, එවැනි වාහන පැදවීමෙහිලා අවුරුදු 1ක පළපුරුද්දක් තිබිය යුතුය.
(ඇ) සෑම වර්ගයකම ගිනිනිවීමේ උපකරණ පිළිබඳව මනා පළපුරුද්දක් හා ඒවායේ භාවිතය, නඩත්තුව ගැන මනා දැනීමක් තිබිය යුතුය.
(ඈ) ගිනිනිවන සහායකයින්ද හසුරුවා ගැනීම හා අධීක්ෂණය කිරීමට හැකියාවක් තිබිය යුතු අතර, නායකත්ව ගතිගුණ තිබිය යුතුය.
(ඉ) අඩුම වශයෙන් කණිෂ්ඨය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්වී තිබිය යුතුය.
(ඊ) අවම උස අඩි 5 යි අඟල් 3 ක් විය යුතුය. අවම බර රා. 110 ක් විය යුතුය.
(උ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අංක 2—

(අ) සාමාන්‍ය පයිප්ප සවිකිරීමේ වැඩ පිළිබඳ (විශේෂයෙන් ඛනිජ තෙල් ව්‍යාපාරය සම්බන්ධව) යටත්පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් තිබිය යුතුය.
(ආ) බවුසර් ටැංකි ඔසවා සවිකිරීම හා ටැංකි රථවල බලවේග පොම්ප (පවර් ටෙක් ඔෆ් පම්ප්ස්) ටැංකි හා නල මාර්ග අලුත්වැඩියා කිරීම ගැන පළපුරුද්දක් ඇති අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.
(ඇ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අංක 3—

(අ) ආරුක්කු විමිනි යනාදිය ඇතුලුව ගඩොල් වැඩ සම්බන්ධයෙන් පුළුල් දැනීමක් තිබිය යුතුය.
(ආ) බදම වැඩ පිළිබඳව හොඳ දැනීමක් තිබිය යුතුය.
(ඇ) වැඩිමනත් ලෙස එමල්ෂන් තීන්ත සම්බන්ධයෙන් දැනුමක් හා ඩිස්ටැම්පර් ඇතුලුව හුණුගෑම පිළිබඳව හොඳ දැනීමක් තිබිය යුතුය.
(ඈ) අපවිත්‍ර ජල ප්‍රවාහන කාණු වැඩ සම්බන්ධයෙන් දැනුමක් තිබිය යුතුය.
(ඉ) සවිගැන්වූ කොන්ක්‍රීට් (රේයින්ෆෝස්) මිශ්‍ර කිරීම දැමීම හා කැපීම් පිළිබඳව දැනුමක් තිබිය යුතුය.
(ඊ) හොඳ කොන්ක්‍රීට් සෑදීමට හැකිවිය යුතු අතර, නොයෙක් වර්ගයේ මිශ්‍රණ ගැන දැනුමක් තිබිය යුතුය.
(උ) සුලු ගොඩනැගිලිවල අත්තිවාරම් සකස් කිරීමට සහ වැඩිමනත් ලෙස සැළසුම් කියවීමට හැකිවිය යුතුය.
(ඌ) වෘත්තියයේ අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුය.
(එ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

අංක 4—

(අ) ඩීසල් තෙල් වලින් ක්‍රියාකරවන පොම්ප නඩත්තු කිරීම පිළිබඳව සංස්ථාවේදී හෝ පිළිගත් වැඩ පොළකදී යටත්පිරිසෙයින් අවුරුදු 2ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
(ආ) නෞකා නිලධාරි විසින් නිකුත් කරන එන්ජින් රියැදුරු සහතිකය හා/හෝ බොයිලර් ක්‍රියාකරවන්නන්ගේ සහතිකය ලබා ඇති අයදුම් කරුවන් හට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(ඇ) කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.
(ඈ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

අංක 5—

(අ) බැටරියක් සෑදෙන පරිදි කෝෂයක් සම්බන්ධ කිරීමටද බැටරි සමුහයක් ශ්‍රේණිගත කර ශ්‍රේණි සමාන්තර ආකාරයට සම්බන්ධ කිරීමටද පුළුවන් විය යුතුය.
(ආ) විවිධ වර්ගයන්හි බැටරි කෝෂ ගැන හොඳ දැනීමක් තිබිය යුතුය.

(ඇ) බැටරිවල නිසි පාවිච්චිය ඒවායේ අවකාශය, ශක්ති ප්‍රමාණය හා විසර්ජන පරිමානයන් ගැන මනා අවබෝධයක් තිබිය යුතු ය.
(ඈ) හයිඩ්රොමීටර් සහ අධික විසර්ජන පරීක්ෂක භාවිතා කිරීම පිළිබඳ පළපුරුද්දක් සහ මනා දැනුමක් තිබිය යුතු ය.
(ඉ) සෑම පිළිවෙලින්ම බැටරි චාර්ජ් කිරීම ගැන හොඳ දැනුමක් තිබියයුතු අතර, බැටරි කෝෂයන්ගේ තත්වය බලා නිශ්චය කිරීම මෙන්ම, පරීක්ෂාකර නිශ්චය කර ගැනීමට හැකියාවක් තිබිය යුතු ය.
(ඊ) බැටරි දුර්වලවීමට හේතුව සහ ඒවාට කළයුතු ප්‍රතිකර්ම පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.
(උ) මෙම කාර්‍යයන් සම්බන්ධයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතු ය.
(ඌ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

සාමාන්‍ය : තෝරාගනු ලබන අපේක්ෂකයන්—

I (අ) සිය ශාරීරික යෝග්‍යතාවය දක්වීම සඳහා පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතු ය.
(ආ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් සිය පරිවාස කාලය තුළදී ලබාගත යුතු ය.
(ඇ) සිය වැටුපෙන් 6%ක් සේවක අර්ථසාධක අරමුදල් සඳහා දයක විය යුතු ය. (ඒ සඳහා සංස්ථාව විසින් 9%ක ප්‍රමාණයක් දයක වනු ඇත.

II තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

ඔබ ලාංකිකයෙකු නම් හා ඉහත දක්වා ඇති සුදුසුකම් තිබේනම් සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම් පත් 1973 නොවැම්බර් මස 09 වෙනි දින හෝ ඊට පෙර–

සේවක මණ්ඩල නිලධාරි (රැකියා),
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 113, ගාලුපාර, කොළඹ 3.

යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.08.20 වෙනි දින දරණ චක්‍රලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා විසින් සඳහන් කළ යුතු ය,

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන).

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
113, ගාලුපාර,
කොළඹ 3,
1973.10.15.

10–858—73.10. 26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සාප 7/98.

### අධ්‍යාපන අමාත්‍යාංශය

### බහු තාක්ෂණික ආයතනයන්හි ගණිතය පිළිබඳ II වැනි ශ්‍රෙණියේ කථිකාචාර්‍ය තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ, බහුතාක්ෂණික ආයතනයන්හි ගණිතය පිළිබඳ II වැනි ශ්‍රෙණියේ කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1973 නොවැම්බර් මස 15 දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ " බහු තාක්ෂණික ආයතනයන්හි ගණිතය පිළිබඳ II වැනි ශ්‍රෙණියේ කථිකාචාර්ය තනතුරු " යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දයකයන් වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නේනම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාලපරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත

3. **වැටුප් සහ දීමනා.**—රු. 6,720 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 360 ක් වාර්ෂික වැටුප් වැඩිවීම් 12කින් රු. 11,040 දක්වා නගින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදල වේ. (මීට අනුරූපව, 1969.10.1 දිනට පෙර පැවති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 4,080—12 × 360—රු. 8,400 ක් විය).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—
(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.
(බී) 73.11.15 වැනි දිනට තමාගේ වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි බව (දනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ).
(සී) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය විෂයයක් සහිතව ලබන ලද බී.එස්. සී. උපාධියක් හෝ සමාන හෝ උසස් සුදුසුකම් ඇති බව,
(ඩී) සිංහල මාධ්‍ය බහු තාක්ෂණික ආයතනවල තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබිය යුතු අතර දෙමළ මාධ්‍ය බහු තාක්ෂණික ආයතනයෙහි තනතුරු සඳහා අයදුම්කරුවන්ට දෙමළෙන් වැඩ කිරීමට මනා දැනුමත් තිබීම, ප්‍රවීනතාවය නොමැති අයදුම්කරුවන් පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළත සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව පිළිබඳ (අදළ විය හැකි පරිදි) නියමිත තත්ත්වයක ප්‍රවීනතාවයක් ලබාගත යුතුය.

**සංලක්ෂ්‍යය** : ඉහත සුදුසුකම් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයන්හි සේවයේ සිටින අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදනම් විය යුතු ය:—
(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසල් ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.);
(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික ;
(සී) චරිත සහතික දෙකක්, (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය) ;
(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;
(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.
(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත අවස්ථාවේ ලැබී, ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද සෑම අයදුම්කරුවකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙලින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් මේ කාර්‍යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973.10.16 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

අංකය : සාප/7/68.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(අගල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

**අධ්‍යාපන අමාත්‍යාංශයේ බහුතාක්ෂණික ආයතනයන්හි ගණිතය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර**

1. නම (මුලකුරු සහිතව) :————.මහතා/මිය/මෙනවිය.

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
   (ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද ? :————.

6. උපන් දිනය :— අවුරුද්ද———. මාසය———. දිනය———.

7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස :— අවුරුදු———, මාස———, දින———

8. දූනට දරන තනතුර පිළිබඳ විස්තර :—
   (අ) තනතුර :———
   (ආ) ස්ථිරද, තාවකාලිකද ? :———.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිතද/රහිතද? :———.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ?———
   (උ) දෙපාර්තමේන්තුව :———.
   (ඌ) ආයතනය/සේවා ස්ථානය :———.
   (ඔ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :———.
   (ඕ) දූනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :———.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතිකද ඇතුළත්ව) :—

| | විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | ............ | ............ | ............ |
| 2. | ............ | ............ | ............ |
| 3. | ............ | ............ | ............ |
| 4. | ............ | ............ | ............ |

10. වෘත්තිය සුදුසුකම් පිළිබඳ විස්තර :—

| | සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | ............ | ............ | ............ | ............ |
| 2. | ............ | ............ | ............ | ............ |
| 3. | ............ | ............ | ............ | ............ |
| 4. | ............ | ............ | ............ | ............ |
| 5. | ............ | ............ | ............ | ............ |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| | ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | ............ | ............ | ............ | ............ |
| 2. | ............ | ............ | ............ | ............ |
| 3. | ............ | ............ | ............ | ............ |
| 4. | ............ | ............ | ............ | ............ |
| 5. | ............ | ............ | ............ | ............ |
| 6. | ............ | ............ | ............ | ............ |
| 7. | ............ | ............ | ............ | ............ |

12. වෘත්තිය අධ්‍යාපනය ලද ආයතන :—

| | ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | ............ | ............ | ............ | ............ |
| 2. | ............ | ............ | ............ | ............ |
| 3. | ............ | ............ | ............ | ............ |
| 4. | ............ | ............ | ............ | ............ |
| 5. | ............ | ............ | ............ | ............ |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න) :—

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| .............................. | .............................. | .............................. | .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. | .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. | .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. | .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. | .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. | .............................. | .............................. | .............................. |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද ? (එසේ නම්, විස්තර දක්වන්න) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–841—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය.

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අත්කම් මෝස්තර සම්පාදක තනතුර**

යථොක්ත තනතුර පිළිබඳව අංක 81—1973 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමෙහි 4 වන ඡේදය යටතේ පහත සඳහන් කොන්දේසිය එක්විය යුතු බව කරුණාවෙන සලකන්න.

"දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශක/පරිපාලක ආදී ශිල්පීය තනතුරක අවුරුදු 10 කට වැඩි සේවයක් ඇති නිලධාරීන් සඳහා කණිෂ්ඨ විභාගය සමත් වී තිබීම ප්‍රමාණවත් වේ."

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරිත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

1973. 10. 17 දින,
කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දීය.

10–916—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ ඔඩ්ඩමාවඩි කොට්ඨාශයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය**

ඔඩ්ඩමාවඩි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සැහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාශාලා, ප්‍රසිද්ධ වෙළඳපොලවල් සහ සමුපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1973.11.30 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1973 ඔක්තෝබර් මස 13 දින,
මඩකලපුව,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

10–920—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්මය පිළිබඳ තුන් අවුරුදු ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට බඳවා ගැනීම—1974 අධ්‍යයන වර්ෂය**

කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පූර්ණකාලීන තුන් අවුරුදු පාඨමාලාව සඳහා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති පිරිමි අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. (දැවුරුදු අධ්‍යයන කාලයක් ආයතනයේදීද තුන්වන වර්ෂය කෘෂිකාර්මික ආයතනයන්හිද වේ).

**සුදුසුකම් :**

(අ) **වයස.**—1974 ජනවාරි පළවෙනිදාට අයදුම්කරුවන් අවුරුදු 16ට අඩු නොවිය යුතුයි.

(ආ) **අධ්‍යාපනික සුදුසුකම්.**—ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව සහ එක් එක් භාෂාවක් සමග අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් එක් වරකදී සමත් වී තිබිය යුතු අතර මෙහි පහතින් දැක්වෙන විෂයයන් සමූහයෙන් එම ව්‍යාවේදීම යටත් පිරිසෙයින් විෂයයක් දෙකකට සම්මාන සමඟ අඩුගණනේ විෂයයන් තුනකින් සම්මාන සාමාර්ථයන් ලබා සිටිය යුතුය :—

(1) ශුද්ධ ගණිතය.

(2) භෞතික විද්‍යාව.

(3) රසායන විද්‍යාව.

(4) ජීව විද්‍යාව

(5) කෘෂිකර්මය.

(6) භූගෝල විද්‍යාව.

**සැ. යු.**—කෘෂිකර්මය සමත්වූවන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආකෘතිපත්‍රයට සෑම ආකාරයකින්ම අනුකූල වන පරිදි අයදුම් පත්‍ර පිළියෙල කළ යුතුයි. සෑම අයදුම්පතක්ම අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ලේඛකාධිකාරී වෙත 1973. 11. 26 වැනි දින හෝ එයට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

ඇතුලත් කිරීම සඳහා ශිෂ්‍යයන් තෝරාගනු ලබන්නේ 2 (ආ) ඡේදයේ සඳහන් විෂයයන් සමූහයේ සහ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මතය.

ටී. ඕ. ඊ. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973. 10. 16,
කොළඹ 2, මැලේ වීදිය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

**කෘෂිකර්මය පිළිබඳ තුන් අවුරුදු ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට ඇතුළු කිරීම—1974 අධ්‍යයන වර්ෂය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලියුම් ලැබෙන ලිපිනය :————.

3. උපන් දිනය (අයදුම්කරුවන්ගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව පිටපතක් පමණක් ඇමිණිය යුතුය) :————.

4. 1974. 01. 01 වැනි දිනට වයස :————.

අවුරුදු :——, මාස :——, දින :————.

5. ජාතිය :————.

6. (අ) අයදුම්කරුවන් විසින් ඉහත 2 (ඇ) සටහනේ දැක්වෙන සුදුසුකම් ලබාගත් අ.පො.ස. (සා. පෙ.) විභාගයේ අවුරුද්ද, මාසය සහ විභාග අංකය :—

අවුරුද්ද :——, මාසය :——, විභාග අංකය :————.

(ආ) විෂයයන් සමත්වී ඇති අන්දම (සාමාන්‍ය සාමාර්ථය, සම්මාන සාමාර්ථය, විශිෂ්ඨ සාමාර්ථයක් ද යන වග) : ————.

| විෂයයන් | සාමර්ථය |
| --- | --- |

7. දෙමව්පියන්ගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය:————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————.

10–886—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

**සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයට පත් කිරීම සඳහාවූ විභාගය—1972 නොවැම්බර්**

පූර්වෝක්ත විභාගයට පෙනී සිටින ලද රජයේ මුද්‍රණාලයීය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයට අයත් අපේක්ෂක අපේක්ෂිකාවන් අතුරෙන් පහත නම් සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන් එකී සේවයේ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයට පත් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමට යටත්ව තෝරාගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රිජ්වේ තිලකරත්න,
ප්‍රවෘත්ති සහ ගුවන් විදුලි අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් 16 දින,
7, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

| නම | විභාග අංකය |
| --- | --- |
| | ඒ. ළ. |
| ප්‍රනාන්දු, පී. ඒ. ජේ | 2 |
| පෙරේරා, ජී. එම්. එස්. | 6 |
| සබානායගම්, කේ. | 8 |
| තිරිමාන්න, ශූ. | 12 |
| සමරකෝන්, ඩබ්ලිව්. ඒ. ඩී. ඒ. | 9 |

10–909–13—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

සිංහල ලඝු ලේඛනය පුහුණු කිරීමේ පන්ති

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන්ට යන සිංහල ලඝු ලේඛනය පුහුණු කිරීමේ පන්තිවලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ඇති ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයටම ඒ සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් දන්වනු ලැබේ. මේ පන්ති අවුරුද්දක් පමණ කාලයක් කාර්යාල වේලාවන් තුළ කොළඹ දී පවත්වනු ලැබේ. පුහුණුවන්නන් 40 දෙනෙකුට පමණ ඉඩ ඇත.

2. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියකම—

(අ) ලාංකික විය යුතුය. ("ලාංකික" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරනු ලැබීමෙන් හෝ ලංකාවේ පුරවැසියකු වන කෙනෙකි).

(ඉ) (i) සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථය සහිතව ලංකා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ii) එකම වාරයක දී අඩු ගණනේ විෂයයන් 5 කින් වත් සමර්ථ වෙමින් විෂයයන් 6 කින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රය ලබා තිබිය යුතුය. මෙකී විෂයයන් 6 අතුරෙන් සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් 4 කින් සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතුය.

(උ) 1973. 11. 20 වැනි දිනට වයස 17 ට අඩු හෝ 22 ට වැඩි හෝ නොවිය යුතුය.

(එ) ඉතා හොඳ චරිතයෙන් හා ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

3. කොළඹ දී පවත්වන සම්මුඛ පරීක්ෂණයකට හෝ විභාගයකට අයදුම්කරුවන්/අයදුම්කාරියන් පෙනී සිටිය යුතුය. ඒවා පවත්වන වේලාව හා ස්ථානය පසුව දන්වනු ලැබේ. ඒ සඳහා ගමන් ගාස්තු හෝ අනෙකුත් වියදම් ගෙවනු ලැබේ. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අයදුම් පතෙහි යම් අසත්‍ය සටහනක් තිබී, තෝරා ගනු ලැබීමට පෙර, ඒ බව දැනගතහොත් එයින්ම ඔහු/ඇ නුසුදුසු වීමටද තෝරා ගනු ලැබීමෙන් පසුව දැනගතහොත් ඔහු/ඇ අස් කර දමනු ලැබීමට ද සිදුවිය හැකිය.

4. පුහුණු වන කාලය තුළ දී කිසිම ගෙවීමක් කරනු නොලැබේ පුහුණුව අවසානයේ දී අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සේවයෙහි හෝ තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ රැකීරක්ෂාදීම ගැන කිසිසේත් ඇප වන්නේ නැත.

5. පුහුණුවීමේ කාලයේ දී වරින් වර පරීක්ෂණයක් පවත්වා ඒවායේ ප්‍රතිඵල අනුව ආධුනිකයන්ට තවදුරටත් පුහුණු වීමට ඉඩ දෙනු ලැබේ. යම් ආධුනිකයකුගේ/ආධුනිකාවකගේ පැමිණීම හෝ ඉගෙනීම හෝ සාමාන්‍ය යෝග්‍යතාව හෝ හැසිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව තෘප්තියට පත් නොවේ නම්, පුහුණුවීමේ කාලය අතර තුර කවර අවස්ථාවක දී වුවත් ඔහු/ඇ පන්තියෙන් වහාම අස් කර දමනු ලබන්නට පුළුවන. එසේ අස් කර දමනු ලැබුවහොත් පසුව පවත්වන පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් වීමට නුසුදුසු වන්නේ ය. කලින් කල නිකුත් කරන ව්‍යවස්ථාවන් හා නියමයන් අනුව කටයුතු කරන බවට ආධුනිකයා/ආධුනිකාව විසින් ම නියමිත පොරොන්දු පත්‍රයක් අත්සන් කළ යුතුය.

6. පුහුණුව අවසානයේ දී යෝග්‍යතාව තීරණය කරන පරීක්ෂණයක් ද, අවසාන විභාගය ඉන් අනතුරුවද පවත්වනු ලැබේ. ලඝු ලේඛනය, යතුරු ලේඛනය සහ සිංහල භාෂාව යන විෂයයන්ගෙන් යුත් මෙම විභාගයෙන් සමත් වන්නන්ට සහතික පත නිකුත් කරනු ලැබේ.

7. දැන දැනම වූ නොසැලකිල්ලක් හෝ තදබල අප්‍රවේසම් කමක් නිසා බඩු නැතිවීමක් හෝ උපකරණ ආදියට හානියක් හෝ වුවහොත් අලාභය ගෙවන බවට ඇප කාරයන් දෙදෙනකු ඇපයට තබා රුපියල් 100 ක ඇප පත්‍රයකට අයදුම්කරුවන් පන්තියට ඇතුළත් කරගනු ලැබූ විට අත්සන් කළ යුතුය.

8. අයදුම්පත් එවිය යුත්තේ පහත අත්සන් කරන නිලධාරි තැනගේ පුද්ගලික නාමයට නොව, "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 598, කොළඹ 7" යන ලිපිනයටය. අයදුම්පත්, මෙහි පහත පළවන ආදර්ශ පිටපත අනුව තමාගේ අත් අකුරෙන් ම ලියා 73. 11. 20 වැනි දිනට හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1973 ඔක්තෝබර් 17 දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දීය.
22, ඊඩ් මාවත, කොළඹ 7.

**සිංහල ලඝු ලේඛනය පුහුණු කිරීමේ පන්තියට ඇතුළත්වීම සඳහා අයදුම්පත**

(1) සම්පූර්ණ නම (පැහැදිලිව ලියන්න) :————.

(2) සම්පූර්ණ ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයකු වූයේ පෙළපතින් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන බව සඳහන් කරන්න) :————.

(4) 1973.11.20 වන දිනට වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. මුල් සහතික පත් නොවේ.) :————.

(5) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(6) විවාහකද ? අවිවාහකද :————.

(7) සමර්ථ වූ උසස්ම විභාගය (විෂයයන් හා දිනය සමග) : ————.

(8) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ අ. පො. ස. ප. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය සහ සම්මාන ලැබූ විෂයයන් (සහතික පිටපත් අමුණන්න. මුල් සහතික නොවේ. සහතික පත් ලැබී නැත් නම් ප්‍රධානාචාර්යවරයාගේ සහතිකයක් හෝ වෙනත් පිළිගත හැකි සහතිකයක් භාරගනු ලැබේ) :——.

(9) ඉගෙනීම ලැබූ පාඨශාලා (දිනයන් සමග) :————.

(10) සිංහල දැනුම් පිළිබඳ විශෙෂ සුදුසුකම් ඇතොත් ඒ බව : ————.

(11) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ලඝුලේඛනය හා යතුරු ලියනය පිළිබඳ දැනුමක් තිබේද ? :————.

12. දත් රක්ෂාවක යෙදී සිටී නම් ඒ බව :————.

(13) පියාගේ හෝ භාරකාරයාගේ නම හා ඔහුට/ඇයට ලියුම් ලැබෙන පිළිවෙල :————.

(14) තමා ගැන තොරතුරු විමසිය යුත්තන් දෙදෙනකුගේ නම් හා ලියුම් ලැබෙන පිළිවෙල :————.

(15) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන්, මේ සහතික පත්වල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි. එක් සහතිකයක් තමා අන්තිමට ඉගෙන ගත් පාසලේ මුල් ගුරුතුමාගෙන් විය යුතුයි. (අවශ්‍ය මුළු සහතික පිටපත් ගණන 3 කි) :————.

(16) වෙනත් සුදුසුකම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–919—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම **දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ඔක්තෝබර් ... | 5.10.73 | සිකුරාද ... | 25. 9.73 | අඟහරුවාද | දවල් 12.00 |
| | 12.10.73 | සිකුරාද ... | 3.10.73 | බදාද | දවල් 12.00 |
| | 19.10.73 | සිකුරාද ... | 10.10.73 | බදාද | දවල් 12.00 |
| | 26.10.73 | සිකුරාද ... | 17.10.73 | බදාද | දවල් 12.00 |
| නොවැම්බර් ... | 2.11.73 | සිකුරාද ... | 24.10.73 | බදාද | දවල් 12.00 |
| | 9.11.73 | සිකුරාද ... | 31.10.73 | බදාද | දවල් 12.00 |
| | 16.11.73 | සිකුරාද ... | 7.11.73 | බදාද | දවල් 12.00 |
| | 23.11.73 | සිකුරාද ... | 14.11.73 | බදාද | දවල් 12.00 |
| | 30.11.73 | සිකුරාද ... | 21.11.73 | බදාද | දවල් 12.00 |
| දෙසැම්බර් ... | 7.12.73 | සිකුරාද ... | 28.11.73 | බදාද | දවල් 12.00 |
| | 14.12.73 | සිකුරාද ... | 5.12.73 | බදාද | දවල් 12.00 |
| | 21.12.73 | සිකුරාද ... | 12.12.73 | බදාද | දවල් 12.00 |
| | 28.12.73 | සිකුරාද ... | 19.12.73 | බදාද | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.